බාලවයස් සිසුවියන්ට ලිංගික අතවර කළ බවට පැවසෙන සිදුවීමක් සම්බන්ධයෙන් ඔවුන්ගේ පාසලේ ගුරුවරයෙකු අත්අඩංගුවට ගැනීමට සෙවීම පිළිබඳ පුවත මාධ්‍ය තුළ ප්‍රමුඛ අවධානයක් දිනාගෙන තිබිණි.

ඒ අනුව, හිරු ටීවී ප්‍රධාන පුවත් විකාශය තුළ අඩංගු වූ මෙම පුවත, හිරු ටීවී YouTube නාලිකාව තුළ, තනි පුවත් ක්ලිපයක් ලෙසින් ද දක්නට ලැබිණි. කෙසේ වුවත්, මෙම පුවත් ක්ලිපයේ මාතෘකාව සඳහන්ව තිබුණේ මේ අයුරිනි.

""අම්මේ ඔයාවත් මාව එච්චර තදට තුරුළු කරගෙන නෑ"- මල් කැකුළු තලා දැමූ ගුරු වෙසින් ආ පාපතරයා"

ඔබ සිතන ලෙසට,

1) මෙම බාලවයස් දැරියන් "මල් කැකුළු" ලෙසින් හඳුන්වමින් සහ ලිංගික අපයෝජනයට ලක්වීම "මල් කැකුළු තලා දැමීමක්" ලෙසින් හඳුන්වන මෙම සිරස්තලය ඔස්සේ මෙම සිදුවීම හැඟීම් කළඹවන සුළු (භාවාතිශය) බවකින් චිත්‍රණය නොකරන්නේ ද? ලිංගික අපයෝජනයක් යනු "මල් කැකුළු තලා දැමීමක්" ලෙසට දැක්වීම ඔස්සේ, එම අපයෝජනයට පත් දැරියන්ට එල්ල විය හැකි සමාජ ගර්හාව හා කොන් කිරීම වැඩි නොවනු ඇතිද?

2) පුවත් වාර්තාකරණයේදී මාධ්‍ය වගකීම වන්නේ, කිසිදු පාර්ශවයක් නොගනිමින්, සමබර භාවය ආරක්ෂා කර ගනිමින් කරුණු සහ තොරතුරු පමණක් ඉදිරිපත් කිරීම යැයි ගත් විට, මෙම සිදුවීමේ සැකකරු "පාපතරයෙකු" වැනි විශේෂණ ඔස්සේ හැඳින්වීම යෝග්‍ය යැයි සිතිය හැකිද?

